# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,937 — 1964 ජනවාරි 31 වැනි සිකුරාද — 1964.1.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 139 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 143 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 144 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 152 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | 154 |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 152 | විවිධ දැන්වීම ... ... ... | 154 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව. තාවකාලික ජීවන දීමනාව. තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන්ට හැරෙන්නට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

---

### විශෙෂ නිවේදනයයි

1964 පෙබරවාරි 4 වැනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1964 පෙබරවාරි 7 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1964 පෙබරවාරි 1 වැනි සෙනසුරාදා දහවල් 12ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1964 ජනවාරි 31 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

---

5. මවගේ නම සහ උත්පත්තියේදී ජාතිය :————.

6. අධ්‍යපන වාර්තාව—ඉගෙනුම ලැබූ පාඨශාලා (දින සහිත) සහ සමත් විභාග පිළිබඳ සම්පූර්ණ විස්තර දක්වමින් :————.

7. පාඨශාලාවෙන් අස්වීමෙන් පසු ඔබ කළ දෑ :————.

8. ලංකා ශිෂ්‍ය භට බලකාය, බාලදක්ෂ ව්‍යාපාර යනාදී සෙවක සංවිධාන වල කළ සේවය :————.

9. වෙනත් උචිත කරුණු :—

## ඉල්ලුම්කරු විසින් අත්සන් කළයුතු ප්‍රකාශය

ඉහත ප්‍රකාශයන්ට මවිසින් සපයන ලද පිළිතුරු මගේ දැනුමේ හැටියට සත්‍ය බැව් ගෞරව පූර්වකව ප්‍රකාශ කර සිටිමි. යුද හමුදා ශිෂ්‍ය භටයින් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය සහ නීතිරීතිද නිලධාරීන්ගේ සේවා විස්තර, අභිවෘද්ධිය සහ කොන්දේසිද ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිඛ කර එය පුවත් පත්හි උපුටා දැක්වූ පරිදි මවිසින් කියවා අවබෝධ කොට ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10. ඉල්ලුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(ඒ) ලංකා යුද්ධ හමුදාවේ ශිෂ්‍ය භට නිලධාරී ඉල්ලුම්කරුවකු වන ........................................................................ ගේ පියා/මව/භාරකරු* මම වෙමි.

(බී) කාකුල්හි රාජකීය යුද හමුදා අභ්‍යාස ආයතනයේ පාඨ මාලාවක් සඳහා තෝරාගනු ලැබුවහොත්, ඉහත නම් සඳහන් ඉල්ලුම්කරු වෙනුවෙන් මෙහි සඳහන් කරුණු සම්බන්ධව වගකීම් මම භාරගනිමි.

(i) ලංකාවෙන් පිටත සිටියදී ඒ සඳහා ඉල්ලුම්කරු විසින් කරනු ලබන සියලු පෞද්ගලික වියදම්.

(ii) ඉල්ලුම්කරු කාකුල්හි සිටින කාලය තුළ අධිකාරිය සඳහා වූ සිය අපේක්ෂකත්වය සිය කැමැත්තෙන්ම අතරමග නතර කළහොත්, එකී ඉල්ලුම්කරු වෙනුවෙන් ලංකාණ්ඩුවෙන් එතෙක් වැය කළ සියලු විය හියදම්, ලංකාණ්ඩුවට ආපසු ගෙවීමටත්, එකී ඉල්ලුම්කරු ආපසු ලංකාවට පැමිණීම සඳහා යන විය හියදම් දැරීමටත්.

(iii) පාඨ මාලාවේ නියුතුව සිටින කිනම් අවස්ථාවක හෝ (විෂමාචාරය නිසා හෝ ඔහුට පාලනය කරගත හැකි හේතූන් නිසා හෝ) අධිකාරිය ලැබීමට නුසුදුසු යයි කාකුල්හි බලධාරීන් වාර්තා කරනු ලැබුවහොත්, ඔහු වෙනුවෙන් ලංකාණ්ඩුව දැරූ සියලු විය හියදම් ආපසු ලංකාණ්ඩුවට ගෙවීමටත්.

————,
අත්සන.

දිනය :————.

නම සහ ලිපිනය : (පැහැදිලි අකුරෙන්) :————.

සාක්ෂිකරු ගේ අත්සන :————.

දිනය :————.

* නුසුදුසු වචන කපා හරින්න.

සී. ඒෆ්. ප්‍රනාන්දු,
ලුතිනන් කර්නල්,
යුද හමුදා ආඥපති වෙනුවට.

1–1021—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒ. 373/එක්ස්. 1463/63.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### පලාලි රජයේ ගුරු විද්‍යාලයේ, සාමාන්‍ය විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුර

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වසාවිලන්, පලාලි රජයේ ගුරු විද්‍යාලයේ සාමාන්‍ය විෂයයන් පිළිබඳ තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළ යුතු අයදුම් පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(අ) මෙරට අයදුම් පත්—1964 පෙබරවාරි මස 14 වැනිදා.

(ආ) පිටරට අයදුම් පත්—1964 පෙබරවාරි මස 21 වැනිදා

සංලක්‍ෂ්‍යය :—(i) අයදුම් පතක් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නො හැක. අවසාන දිනය දක්වා අයදුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුයි.

(ii) විදේශීය අයදුම්කාරයන්ට අවශ්‍ය වන මුද්‍රිත අයදුම්පත් පෝරම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ය. තම තමා ගේ අයදුම් පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවීම සඳහා තමා පදිංචි රටට හෝ තමාට ආසන්නවම රටට හෝ පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කාරයින්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) වෛද්‍ය පරීක්‍ෂණය හා ගමන් ගාස්තු—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයින් ඉදිරියෙහි වෛද්‍ය පරීක්‍ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. එම පරීක්‍ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ ගමන් ගාස්තුවත් ඔවුන් විසින්ම දැරිය යුතු වේ.

2. වැටුප් දීමනා.—මෙම තනතුර සඳහා රු. 5,160—360 වැටුප් වැඩිවීම් 9—රු. 8,400 ක වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිත ය.

3. සේවා කොන්දේසි : මෙම තනතුර සඳහා පාසැල් ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ගුරුවරයෙකු ලෙස විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ ශික්ෂකයෙක් මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබී නම් ඔවුන් විසින් දරණ තාක් මෙම තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් ලෙස ප්‍රකාශ කරනු ලැබේ.

4. අධ්‍යාපනික හා අනිකුත් අවශ්‍ය සුදුසුකම් : සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔවුන් පිළිබඳ පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) 1964 පෙබරවාරි මස 14 වැනි දිනට වයස අවුරුදු 28ට නො අඩු බවට හා අවුරුදු 50ට නොවැඩි බවට. (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරණ අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොසලකා සලකා බලනු ඇත.)

(බී) (i) ඉල්ලුම්කරු පශ්චාත් උපාධි හෝ අන්‍ය අන්දමේ සම්පූර්ණ කාල පුහුණුවක් ලැබූ උපාධිධරයෙක් විය යුතුය. උපාධිය ලැබීමෙන් පසු අවුරුදු 5ක් ඉගැන්වීමේ පළපුරුද්ද හා ඔවුන්ට ඉංග්‍රීසි පිළිබඳ උසස්ම දැනීමක් තිබීම.

(ii) තෝරනු ලබන අයදුම්කරුට ඉංග්‍රීසි ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුයි. ඉංග්‍රීසි භාෂාව ද්විතීය භාෂාවක් වශයෙන් ඉගැන්වීමේ අභ්‍යාස පාඨ මාර්ගයක් අනුගමනය කර තිබෙන්නන්ට වැඩි සැලකිලි දක්වනු ලැබේ.

(iii) ඔවුන්ට දෙමළ භාෂාවෙන් දේශන පැවැත්වීමට හැකියාවක් තිබිය යුතුයි.

(සී) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සනීපයෙන් යුක්ත බවට.

5. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදුව, නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බව හෝ ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් ඒවා පිළිගත් බව නිර්දේශ නො කළහොත් එම අයදුම් පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍යවනු ඇත.:—

(ඒ) උප්පැන්න සහතිකය.—(සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසැල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(බී) උපාධි සහතික පත්‍ර හෝ උසස්ම අධ්‍යාපනික සහතික පත්‍ර.

(සී) මේ තනතුරට පත් කිරීමට යෝග්‍ය බවටත්, චරිතය සම්බන්ධවත්, අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳවත් ළඟදී ලබාගන්නා ලද සහතික තුනක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මෙහි සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

සැලකිය යුතුයි :—

(i) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(ii) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම් පත්‍ර සලකා බලනු නො ලැබේ.

7. තෝරාගනු ලැබූ අපේක්ෂකයා පළමුවෙන්ම පලාලි රජයේ ගුරු විද්‍යාලයට අයත්ව සේවය කරන නමුත් මාරුකර යැවීමට ඉඩ ඇත.

8. අයදුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට පෞද්ගලිකව නො එවිය යුතු යි.

9. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන කොන්දේසි ද බලනු මැනවි.

10. අයදුම් පත්‍ර සියල්ලම ලැබුන බව දන්වනු ඇත. අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින 7ක් ඇතුළත තම අයදුම් පත්‍රය ලැබුන බව දන්වන ලිපියක් නො ලත් අයදුම් කරුවන් වේ නම් ඔහු විසින් ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත වහාම දන්විය යුතුයි. කිසියම් අයදුම් කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය අහිමි වනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

කොළඹ 1, ගාළුමුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
නැ. පෙ. 500,
1964 ජනවාරි මස 25 වැනි දින.

1–993—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගය—1963

1964 ජනවාරි මස 10 දින අංක 13,914 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද ප්‍රතිඵලවලට අමතරව නැගෙනහිර හා උතුරු පළාත්වල සේවයට තෝරා ගන්නා ලද සිංහල මාධ්‍යයීය අයදුම්කරුවන්ගේ නම් පහත දැක්වේ.

තෝරා ගන්නා ලද සංඛ්‍යා අධ්‍යාපන අධ්‍යක්ෂ තුමන්ගේ අවශ්‍යතා අනුවය.

එච්. එල්. විමලසූරිය,
වැ.බ. විභාග කොමසාරිස්.

### මඩකලපුව

| | | |
|---|---|---|
| විද්‍යා. | 1. | නැත |
| ඉංග්‍රීසි. | 2. | නැත |
| සාමාන්‍ය. | 3. | ජේ. වී. ඩී. ඩයස්, ඩබ්. 32 බී |
| | 4. | ජේ. ඩී. ඩබ්. පෙරේරා, ඩබ්. 32 ඩී |
| | 5. | එම්. එච්. ජේමවතී ද සිල්වා (ගැ), ඩබ්. 48 |
| | 6. | ඩබ්. කේ. ජී. ආරියදාස, ඩබ්. 17 |
| | 7. | ජේ. බී. දයාරත්න ඩබ්. 20 |
| | 8. | එම්. එස්. සෝමවතී (ගැ), ඩබ්. 56 බී |
| | 9. | ආර්. සිරිසේන, ඩබ්. 28 |
| | 10. | ඇස්. ඇම්. පී. වියුලට් ද සිල්වා (ගැ), ඩබ්. 47 |
| | 11. | ටී. කමලාවතී පියසේන (ගැ), ඩබ්. 56 ඩී |
| | 12. | ජී. ඩී. සුමනාවතී (ගැ), ඩබ්. 50 |
| | 13. | එච්. ඒ. ඇම්. ඩිංගිරිඅම්මා (ගැ), ඩබ්. 56 සී |
| | 14. | ජී. ඊ. අබේරත්න, ඩබ්. 14 |
| | 15. | ලී. ඉඹුල්ගොඩ (ගැ), ඩබ්. 56 ඒ |
| | 16. | ඇල්. ඒ. විනී (ගැ), ඩබ්. 56 ජී |
| | 17. | ජී. ජී. සෝමාවතී (ගැ), ඩබ්. 56 එජ් |
| | 18. | ඇස්. ඒ. ඉන්ද්‍රපාල, ඩබ්. 32 සී |
| | 19. | ආර්. කේ. විමලාවතී (ගැ), ඩබ්. 56 |
| | 20. | ඊ. එම්. සී. නුගපිටිය, ඩබ්. 27 |
| | 21. | ඩබ්. කේ. ධර්මදාස, ඩබ්. 23 |
| | 22. | ඩබ්. වාටින්, ඩබ්. 18 |

### ත්‍රිකුණාමලේ

| | | |
|---|---|---|
| විද්‍යා. | 1. | නැත |
| ඉංග්‍රීසි. | 2. | පී. ඩබ්. සොම්ලියා (ගැ), ඩබ්. 125 |
| | 3. | ඇස්. ඇම්. මිසිනෝනා (ගැ), ඩබ්. 111 |
| | 4. | ඇ. ලියනගේ (ගැ), ඩබ්. 109 |
| සාමාන්‍ය. | 5. | පී. ජයසේකර, ඩබ්. 72 |
| | 6. | ජී. බන්දුවතී ශ්‍රේරු (ගැ), ඩබ්. 100 |
| | 7. | ජී. ජී. එදිරිසිංහ, ඩබ්. 146 |
| | 8. | එම්. ඩබ්. එඩ්වඩ් ද සිල්වා, ඩබ්. 85 |
| | 9. | ඒ. ඒ. කරුණාවතී (ගැ), ඩබ්. 107 |
| | 10. | ඊ. එජ්. අබේසේකර, ඩබ්. 133 |
| | 11. | පී. ධර්මසේන, ඩබ්. 143 |
| | 12. | ටී. ජී. ආරියරත්න, ඩබ්. 60 |
| | 13. | ජයාවතී පට්ටිආරච්චි (ගැ), ඩබ්. 231 |
| | 14. | කේ. ඩබ්. ගුණවර්ධන (ගැ), ඩබ්. 101 |
| | 15. | ටී. තිලකා කුලරත්න (ගැ), ඩබ්. 213 |
| | 16. | ඩී. ටී. සේසත්පුර (ගැ), ඩබ්. 237 |
| | 17. | සී. වී. යසවතී (ගැ), ඩබ්. 253 |
| | 18. | පී. පී. ඒ. ස්ටීවන්, ඩබ්.86 |
| | 19. | ඇස්. ඒ. සෝමාවතී (ගැ), ඩබ්. 240 |
| | 20. | ඇම්. පී. මාලනී පෙරේරා (ගැ), ඩබ්. 117 |
| | 21. | ඒ. එච්. ආරියසේන, ඩබ්. 57 |
| | 22. | ඒ. බී. සෝමාවතී (ගැ), ඩබ්. 128 |
| | 23. | සී. ජයසුන්දර, ඩබ්. 156 |
| | 24. | ජ. මවුදාස, ඩබ්. 79 |
| | 25. | ඩබ්. ඇම්. සීලලතා (ගැ), ඩබ්. 249 |
| | 26. | ඒ. එච්. ධර්මදාස, ඩබ්. 65 |

### උතුරු පලාත

| | | |
|---|---|---|
| විද්‍යා. | 1. | එස්. ඒ. ප්‍රේමදාස, එක්ස්. 37 |
| ඉංග්‍රීසි. | 2. | ඊ. ලෝගනායකී (ගැ), එක්ස්. 1 |
| සාමාන්‍ය. | 3. | ඇම්. රන්බන්ඩා, එක්ස් 38 |
| | 4. | ඇස්. කරුණාරත්න, එක්ස්. 33 |
| | 5. | කේ. ඒ. ගුණරත් මැණිකේ (ගැ), එක්ස්. 52 |
| | 6. | ඊ. ඇම්. කුමා (ගැ), එක්ස්. 55 |
| | 7. | ටී. ඇම්. පියශීලි (ගැ), එක්ස්. 61 |
| | 8. | ඇම්. බී. ආරියදාස, එක්ස්. 26 |
| | 9. | ජී. ඥානවර්ධන, එක්ස්. 34 |
| | 10. | ඇන්. ආර්. සී. ගුණවර්ධන, එක්ස්. 11 |
| | 11. | ආර්. ඩී. මඩුකන්ද, එක්ස්. 36 |
| | 12. | එස්. ඒ. මිලිනෝනා (ගැ), එක්ස්. 59 |
| | 13. | කේ. සෝමාවතී (ගැ), එක්ස්. 65 |
| | 14. | ජේ. පී. ගුණසීලි (ගැ), එක්ස්. 76 |
| | 15. | ඒ. කුසුමාවතී (ගැ), එක්ස්. 54 |
| | 16. | පී. ඇම්. තෙන්නකෝන් (ගැ), එක්ස්. 67 |
| | 17. | පී. වී. ටිකිරා, එක්ස්. 44 |
| | 18. | ආර්. එම්. පී. පෙරේරා, එක්ස්. 17 |
| | 19. | කේ. බී. නන්දවතී (ගැ), එක්ස්. 60 |
| | 20. | කේ, ජී. එල්. රණසිංහ, එක්ස්. 4 |

1–965—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

ඊ. 5 ඒ/62

## ගණකාධිකාරි සේවයේ IV වැනි පන්තියට පත්කිරීමේ විභාගය—1963

ඉහත සඳහන් විභාගය සම්බන්ධයෙන්, 1963 නොවැම්බර් මස 29 වැනි දින අංකය 13,837 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1963 නොවැම්බර් මස 25 වැනි දින දරණ නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කළ බව මෙයින් දන්වනු ලැබේ.

(1) 4 වැනි ඡේදයේ සංලක්‍ෂ්‍යය කපා හැර ඒ වෙනුවට මෙසේ යොදන්න :

සංලක්‍ෂ්‍යය :—ඉහත සඳහන් 4(ඇ) (i) සිට (xv) දක්වා වර්ගවලට අයත් නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුස්සන් වීමට, 1963 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයේ IV වැනි ශ්‍රේණියෙන් සමත් වී සිටිය යුතුය.

(2) 7 (iii) වැනි ඡේදය කපා හරින්න.

(3) 8 (iii) වැනි ඡේදය කපා හැර ඒ වෙනුවට මෙසේ යොදන්න.

8 (iii) රු. 4,080ක වාර්ෂික වැටුපකින් පටන්ගෙන රු. 360ක වැටුප් වැඩිවීම් එකොලොසකින් වර්ෂයකට රු. 8,040 දක්වා වැඩිවන වැටුප් ක්‍රමයක් හිමිවේ. මෙම විභාගයෙන් සමත්වන රජයේ සේවයේ දැනටමත් නියුක්තව සිටින අපේක්‍ෂකයන් පත්වීම් ලබන දින සිට අවුරුද්දක් ඇතුළත දී ගණකාධිකාරි හා මුදල් කටයුතු සම්බන්ධව ප්‍රායෝගික සිංහල පිළිබඳ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත්විය යුතුය. මෙම පරීක්ෂණයෙන් සමත්වීමට නොහැකිවීම වැටුප් වැඩිවීම් ප්‍රමාද කිරීමට හේතුවෙයි.

2. 1963 නොවැම්බර් මස 29 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළ කළ 1963 නොවැම්බර් මස 25 වැනි දින දරණ නිවේදනයේ 9 (ඇ) ඡේදයේ ප්‍රකාර අයදුම්පත් ඉල්ලා අස් කර ගත් අයදුම්කරුවන් වෙත ඉහත සඳහන් කර ඇති 4 වැනි ඡේදයේ සංලක්ෂය යටතේ සුදුසුකම් තිබේ නම් මෙම විභාගය සඳහා නැවත ඇතුළත්වීමට ඉඩදෙනු ඇත. ඒ අනුව එවැනි අයදුම්කරුවෙකු මෙම විභාගයට නැවත ඇතුළත් වීමට කැමැත්තේ නම් ඒ බව ඔහුගේ දෙපාර්තමේන්තු ප්‍රධානයා මාර්ගයෙන් ඒ සුදුසුකම් ඔහු වෙත තිබේද යනුද සඳහන් කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. එවැනි ලිපි 1964 පෙබරවාරි මස 14 වැනි දින හෝ ඊට පළමු රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබිය යුතුය.

සී. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 ජනවාරි මස 23 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 500,
කොළඹ.

1–992—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ, මහා භාණ්ඩාගාරයේ 257 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1) ඔලිව් ග්‍රීන් ඩ්‍රිල් සැපයීම සඳහා 64. 4. 28 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1964. 4. 27 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර්කරුවන් සඳහා විශේෂ ටෙන්ඩර පෝරම සකස් කර තිබේ. රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ.

ටෙන්ඩර්කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
වැඩබලන ගබඩා අධිකාරී.

1964. 1. 31 වැනි දින,
කොළඹ දී ය.

1–985—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ, මහා භාණ්ඩාගාරයේ 276 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) කපු කැන්වස් සැපයීම සඳහා 1964 මාර්තු 10 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලබේ.

කොළඹ, පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1964 මාර්තු 9 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1964. 1. 31 වැනි දින,
කොළඹ දී ය.

1–986—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

ගමනාගමන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1964 මාර්තු මස 4 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට ටොන් 40හේ ට්‍රේලරයක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1964 මාර්තු මස 4 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්‍ෂණ කළ හැක. රු. 50 මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1964 මාර්තු මස 2 වෙනි සඳුදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස්.

1964 ජනවාරි 21 දින,
කොළඹ, වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

1–879—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මහියංගනය උප කොට්ඨාශය

1. අරන් අමුණ ව්‍යාපාරය වැඩි දියුණු කිරීම සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 26 වෙනි බදාදා පෙරවරු 10 දක්වා බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 22,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1964 පෙබරවාරි මස 22 වන සෙනසුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී මහියංගනය උප කොට්ඨාශය භාර නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝරමවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා උප කොට්ඨාශ භාර නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් උප කොට්ඨාශ භාර නිලධාරි තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුළදී මහියංගනය උප කොට්ඨාශය භාර නිලධාරි තැනගෙන් ලබාගත හැකිය.

එච්. ඩී. සී. ගුණවර්ධන,
උප කොට්ඨාශ භාර නිලධාරි,
මහියංගනය උප කොට්ඨාශය.

1-907—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට දැව සැපයීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 පෙබරවාරි මස 21 වැනි දින පස්වරු 2.30 වන තෙක් දැව සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. පෝර්මකොළ පේරාදෙණියේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රුපියල් 10ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි දැන්වීම බලන්න.

ඒ. ඊ. ඇම්. සිල්වා,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964 ජනවාරි මස 21 වැනි දින,
පේරාදෙණිය.

1-910—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොළොන්නරුවේ සත්ව ගොවිපලට පිදුරු ටොන් 60 ක් සඳහා ටෙන්ඩර් කැඳවීම

1964.1.10 දින අංක 13.913 දරණ ගැසට් පත්‍රයේ පළ කැරුණු මගේ 63.12.30 දිනැති දැන්වීමේ ඉහත සඳහන් අවශ්‍යතාවය පිළිබඳ කරුණ මෙයින් අවලංගු කරමි.

ඒ. ඊ. ඇම්. සිල්වා,
වැ. බ. කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1964. 1. 22 දින,
කොළඹ 1, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

1-921—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බදුල්ල පිහිටි නි. මි. යෝ. ක්‍ර. ගබඩාවට 1964.12.31 අවසන් කාලය දක්වා ප්‍රවාහන සේවා සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1964 පෙබරවාරි 21 වැනි සිකුරාදා අ. භා. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

2. දිවයිනේ කච්චේරියකින් හෝ අංක 60, හෝර්ටන් පෙදෙසෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තැනට රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කොට 1964 පෙබරවාරි 21 වැනි සිකුරාදා දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නි. මි. යෝ. ක්‍ර. හා වී. කෙ. අංශය පිහිටි අංක 336, ඩීන්ස් පාර, මරදාන කාර්යාලයෙන් ලබාගත හැක.

3. වැඩි විස්තර බදුල්ලේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. සිත්තම්පලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට,
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම).

1964 ජනවාරි 31 දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10.

1-943—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටි හුලන්දමය, නාමල් ඔය සහ ඇතිමොල වැව යන ව්‍යාපාරවලට 1963/64 මුදල් වර්ෂයේ දෙවැනි භාගය සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ටෙන්ඩර කැඳවීමයි.

අළුත්නුවර, ඉඩම් සංවර්ධන නිලධාරි විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටි ඉහත සඳහන් ව්‍යාපාරයන්ට පහත සඳහන්වන ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් වූ ටෙන්ඩර පත් 1964.2.25 දින සවස 2 දක්වා භාරගනු ලැබේ:—

(1) පොල් අතු (ඉරු දෙකකින් හා දිගින් අඩි 7 කුත් පළලින් 18" නො අඩු විය යුතුයි).

(2) කළු ගල් 6" × 9" ප්‍රමාණය. (කියුබ් ගණනින්).

(3) පිළිස්සූ ගඩොල් (ප්‍රමාණය $8\frac{3}{4}'' \times 4\frac{1}{2}'' \times 2\frac{3}{4}''$) (දහස් ගණනින්. පෝරණුව ව්‍යාපාරයේ සිට සැතපුම් 5 ඇතුළත විය යුතුයි.)

(4) කැට ගල්. $2''$, $1\frac{1}{2}''$, $1''$, $\frac{3}{4}''$, $\frac{1}{2}$. (කියුබ් ගණනින්).

(5) ගංගා වැලි (කියුබ් ගණනින්).

(6) අළු හුණු (බුසල් ගණනින්. බුසලක් රාත්තල් 44 කට නොඅඩු විය යුතුයි).

(7) තැම්බූ හුණු (බුසල් ගණනින්).

2. පහත සඳහන් සැපයීම් වෙනුවෙන් මිළ ගණන් වෙන වෙනම දක්විය යුතුයි:—

(අ) වත්තේදී, පෝරණුවේ දී, ගල්වලේදී, දෙපාර්තමේන්තු වාහනයන්ට. (මෙම ස්ථානයන්ට ලොරි යාහැකි විය යුතුයි).

(ආ) වැඩ අංශයන්ට ගෙනැවිත් භාර දීමට.

3. මගේ කාර්‍යාලයේ හෝ ඕනෑම දිසාපති කාර්‍යාලයක හෝ රු. 50ක් එක් එක් ව්‍යාපාරයන් වෙනුවෙන් තැන්පත් කර. එම මුදල තැන්පත් කල බැව් පැවැසෙන කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර පෝර්මයන් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර පෝර්මයන් 1964.2.22 දින දක්වා නිකුත් කරනු ලැබේ.

4. පිළිගත් ටෙන්ඩරකරු විසින් දෙසතියක දැනුම් දීමෙකින් පසු මගේ ඇණවුම් අනුව අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයිය හැකි විය යුතුයි. මාගේ ඇණවුම් අනුව අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයිය නොහැකිවන ටෙන්ඩර් කරුවන්ගේ ඇප මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුළත් කිරීමට ද ඉඩ ඇත.

5. ටෙන්ඩරකරුවන්ට අවශ්‍ය නම් ටෙන්ඩර විවෘත කරන දිනයේදී, එනම් 1964.2.25 දින පසුවරු 2 ට පැමිණ සිටිය හැක.

6, මේ සම්බන්ධයෙන් වූ අනිකුත් විස්තර පහත අත්සන් කරන මගෙන් ලබා ගත හැක.

1964 ජනවාරි මස 20 දින,
වේරගන්තොට, අළුත්නුවර,
ඉඩම් සංවර්ධන කාර්‍යාලයේදීය.

අළුත්නුවර, ඉඩම් සංවර්ධන නිලධාරි.

1-971—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### තලේමන්නාරමෙහි කොරන්ටයින් කඳවුරේ ගැලුම් 5,000 ක ජල තටාකයක් තැනීම සඳහා ටෙන්ඩර්

තලේමන්නාරමෙහි කොරන්ටයින් කඳවුරේ උස් කර තැනිය යුතු ගැලුම් 5,000 ක ජල තටාකය සඳහා ටෙන්ඩර් 1964. 2. 21 දින පෙරවරු 11 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් භාර ගනු ලැබේ.

2. 64.2.20 දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුය.

3. තැන්පත් මුදල් ආපසු ඉල්ලන විට ලබාගත් රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩරවලට ඒවා ඇමිණියයුතු නොවේ.

4. සියළු ටෙන්ඩර් කවරයන්හි වම්පස කෙළවරේ “ තලේමන්නාරමේ ගැලුම් 5,000 ක් අල්ලන ජලටැන්කියක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ” යනුවෙන් සඳහන්කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුය. කවරයේ වම්පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාර දිය යුතුයි.

5. ටෙන්ඩරය සමග සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයට යම්කිසි වෙනස් වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් බාරගත් වැඩය මාස 3 ක් ඇතුළතදී නිමකළ යුතුය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු වැඩය පටන් නොගතහොත් හෝ ගිවිසුමකට බැඳීමට ඇප මුදල නොබැඳවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නම ද ඇතුළත් වන්නේ ය.

7. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 64.2.21 වෙනි දින දහවල් 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

8. ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාරගැනීමේ බලය රජය සතුවේ.

9. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් විමසන්න.

සී. විස්වාසම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1, 24.1.64.

1–973—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

කොළඹ ඇච්ලන් චතුරශ්‍රයෙහි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින්, කිරිලපොන (කොළඹ 6) මධ්‍යම වැඩ පොලෙහි සේවයට අදාල නොවූ පහත සඳහන් රථ වාහන, විකිණීම සඳහා, ටෙන්ඩර් 1964 පෙබරවාරි මස 14 වෙනි දින, පෙරවරු 11.00 වන තෙක් භාර ගනු ලැබේ.

| | වාහන අංකය | | වර්ගය | විස්තර |
|---|---|---|---|---|
| 1. | සී. ඊ. | 3392 | පෝඩ් ලොරිය | සම්පූර්ණයෙනි |
| 2. | සී. ඊ. | 4097 | ඩොජ් ලොරිය | ඇන්ජිම නැත |
| 3. | සී. ඊ. | 4475 | ඩොජ් ලොරිය | කැබලි වශයෙන් ඇත. ඇන්ජිම නැත |
| 4. | | 8276 | ජීප් | සම්පූර්ණයෙනි |
| 5. | සී. එල්. | 5523 | ඩොජ් ලොරිය | සම්පූර්ණයෙනි |
| 6. | | 7236 | එම | පසුපස ඩිෆරන්ෂලය හා ටයර් නැත |
| 7. | | 7390 | ඩොජ් ලොරිය | සම්පූර්ණයෙනි |
| 8. | | 7923 | බෙඩ්පෝර්ඩ් ලොරිය | සම්පූර්ණයෙනි |
| 9. | සී. එන්. | 657 | පෝර්ඩ් ලොරිය | ඇන්ජිම නැත |
| 10. | | 1085 | පෝර්ඩ් ලොරිය | සම්පූර්ණයෙනි |
| 11. | | 1520 | මොරිස් කොමාර්ෂල් ලොරිය | සම්පූරණයෙනි |
| 12. | | 2190 | එම | ඇන්ජිම නැත (කැබලි වශයෙනි) |
| 13. | | 2461 | එම | සම්පූර්ණයෙනි |
| 14. | | 2943 | මොරිස් කො/ලොරිය | සම්පූර්ණයෙනි |
| 15. | | 2979 | මොරිස් කො/ලොරිය | එම |
| 16. | | 6366 | ඔස්ටින් ලොරිය | ඇන්ජිම රහිතයි |
| 17. | | 8053 | විලිස් ජීප් | කැබලි වශයෙන් තිබේ. (ඇන්ජිමද සමග) |
| 18. | අයි.සී. | 731 | මො/කොමාර්ෂල් ලොරිය | සම්පූර්ණයෙනි |
| 19. | අයි.සී. | 762 | එම | ඇන්ජිම නොමැතිව (කැබලි වශයෙනි) |
| 20. | | 853 | ඔස්ටින් ලොරිය | ඇන්ජිම සමග කැබලි වශයෙනි |
| 21. | අයි.සී. | 997 | මොරිස් කොමාර්ෂල් ලොරිය | සම්පූර්ණයි |
| 22. | අයි.සී. | 1099 | ඔස්ටින් ලොරිය | සම්පූර්ණයෙනි . (ඇන්ජිම ගලවා වාහනය ඇතුලේ ඇත) |
| 23. | | 1110 | ඔස්ටින් ලොරිය | සම්පූර්ණයි |
| 24. | අයි.සී. | 1715 | පෝර්ඩ්සන් ලොරිය | ඇන්ජිම රහිතයි |
| 25. | අයි.සී. | 1716 | එම | ඇන්ජිම රහිතයි |
| 26. | අයි.සී. | 1836 | පෝඩ්සන්ලොරිය | ඇන්ජිම රහිතයි |
| 27. | | 1876 | එම | ඇන්ජිම රහිතයි (ඉදිරිපස රෝද හා ඩිෆරන්ෂල් නැත) |
| 28. | | 1917 | පෝර්ඩ්සන් ලොරිය | ඇන්ජිම නැත (කැබලි වශයෙන් තිබේ) |
| 29. | | 1942 | එම | ඇන්ජිම රහිතයි |
| 30. | අයිසී | 1986 | එම | ඇන්ජිම රහිතයි |
| 31. | | 1990 | එම | ඇන්ජිම නොමැතිව |
| 32. | | 2073 | එම | වැසිය පමණයි (පසුපස රෝද සමග) |
| 33. | | 2117 | එම | ඇන්ජිම නොමැතිවයි |

2. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් 1964 පෙබරවාරි මස 13 වෙනි දින දවල් 12 වනතෙක් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයෙහි හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රුපියල් 50ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පෝර්ම බහාලු කවරය මුද්‍රා ද තබා එහි උඩ වම් කෙළවරෙහි "සේවයට අදල නොවූ රථ වාහන මිල දී ගැණීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන දෙපාර්තමේකතුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, ඇවිලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර් ලියා පදිංචි කළ තැපැලෙන් හෝ තමා විසින් ම ගෙනැවිත් දීමෙන් හෝ තමාගේ නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාර දී ලැබුණ බව හැඟවීමේ කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. කොළඹ ඇවිලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 1964 පෙබරවාරි මස 14 වෙනි දින පෙරවරු 11.00ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර් කරුවන්ට ඒ අවස්ථාවේ පෙනී සිටිය හැක.

5. ටෙන්ඩර් කිරිමට අපේක්ෂා කරන්නන් එසේ කිරීම්ට ප්‍රථමයෙන් කිරිලපොන මධ්‍යම වැඩපොළෙහි දී, වාහන පරික්ෂා කළ යුතුයි. ටෙන්ඩරයේ ඇතිවන සියළු වෙනස් කිරිම් හෝ මැකීම් ටෙන්ඩර් කරු විසින් සහතික කළ යුතුයි.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ ටෙන්ඩරය පිළි ගත් බැව් දන් වූ විට ටෙන්ඩර්කරනු ලැබූ මුදල් දින 10ක් ඇතුළත දී ගෙවිය යුතුයි. ඊට පසු දින 14ක් ඇතුළත දී ගන්නා ලද වාහන අස්කර ගත යුතුයි. බැහැර කිරිම සඳහා තමන් විසින්ම පිළිවෙලක් යොද ගත යුතුයි. නියමිත කාලය තුලදී අස්කරගනු නො ලබන සියළුම වාහන ආදිය නැවත විකිණීමෙන් හෝ අන් අයුරකින් හෝ ඉවත්කරණු ලැබෙ. ඊට පසු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැනගේ අනුදැනුම ඇතිව විනා අන්කිසි අයුරකින් වාහන සඳහා ඉදිරිපත් විය නොහාක. යම් හෙයකින් සාර්ථක වූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව පැහැර හැරිය හොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නම ද ඇතුළත් වන්නේ ය.

7. කැමති වාහන ගණනකට හෝ සියල්ලට ම ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අතර, ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම හෝ කොටස් වශයෙන් භාර ගැණීමේ හෝ නො ගැණීමේ අයිතිය, රජය සතුය.

සී. ද පොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇවිලන් චතුරශ්‍රය. කොළඹ 1,
1964 ජනවාරි මස 23 දින.

1-972—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පැලැන්දෙනි පැලැන් ගඟ හරහා පාලමක් ඉදී කිරීම

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති තැන විසින් කළුතර දිස්ත්‍රික්කයේ, උතුරු මහපත්තුවේ පැලැන් ගඟ හරහා පාලමක් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් 1964.3.3 දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ.

2. ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂතැනගෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ මහා ලේකම් කාර්යාලයේ අංක 355 දරණ කාමරයේදී 1964.3.3 දින පෙ. ව. 10ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පෙනී සිටිය හැක.

3. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා රු. 100,000 හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් 1964 පෙබරවාරි මස 27 වැනි දින දාවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රධාන කාර්යාලයේ හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර රු. 250ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් ප්‍රකාර ලියා පදිංචි වී තිබේදැයි ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඔප්පු කළ යුතුය. ටෙන්ඩර්කරුවෝ ආර්. සී. පාලම් ඉදි කිරීම සඳහා හෝ එවැනි වැඩ සඳහා හෝ පුහුණුවක් ඇත්තන් ද යන බැව්ද යෝග්‍ය කාර්‍ය මණ්ඩලයක් සහ උපකරණාදිය ඇති බැව්ද ඔප්පු කළ යුතු වෙත්.

4. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැන විමසන්න.

සී. ද ෆොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

1964.1.21.

1-975—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය, මහකනදරාව, අත්ගමුව, සේනපුර, යකල්ල, පදවිය හා අනුරාධපුර නව නගරයට හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ උස්ගල සියඹලන්ගමුවටද පුත්තලම් දිස්ත්‍රික්කයේ විල්පොත හා වනාතවිල්ලුවට ද මන්නාරම් දිස්ත්‍රික්කයේ තලෙසි මන්නාර් කොරන්තීනු කඳවුරටද ගොඩනැගිලි උපකරණ සැපයීම

ඉහත සඳහන් ව්‍යාපාරයන්ට පහත දැක්වෙන ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා 1964.2.20 දින පෙ. ව. 11 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) ඉරු දෙකේ පොල්අතු (දිගින් අඩි 7කට හා පළලින් අඟල් 18කට වඩා අඩු නොවිය යුතුය.)
(2) අලුහුණු—බුසල් ගණනින් (රු. 44කට අඩු නොවිය යුතුයි.)
(3) තම්බාපු හුණු—බුසල් ගණනින්.
(4) ගල් කැබලි (6" × 9") කියුබ් ගණනින්.
(5) කළුගල් කියුබ් ගණනින් ($\frac{3}{4}$" සිට 2" දක්වා.)
(6) පිලිස්සූ ගඩොල් ($8\frac{3}{4}$" × $4\frac{1}{2}$" × $2\frac{1}{4}$") 1,000 බැගින්.
(7) ගංවැලි කියුබ් ගණනින්.

2. වත්තෙන්, පෝරණුවෙන් හා ගල් වලින් භාරදීමට හා ව්‍යාපාර ගබඩාවලට හා වැඩපලට ගෙනැවිත් භාරදීම සඳහා වෙන වෙනම මිල ගණන් දැක්විය යුතුය.

3. මෙම කාර්‍යාලයේ හෝ කච්චේරියක හෝ රු. 50ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි. 1964.2.18 දින දාවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් නියෝගය ලැබී සති 2ක් ඇතුළත දී උපකරණ සැපයිය යුතුයි. යමෙක් එසේ සැපයීම මගහැරියහොත් හෝ පැහැර හැරියහොත්, ඔහුගේ නම කොන්දේසි කඩකළ රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා පමණක් නොව ඔහුගේ තැන්පත් මුදලද රාජසන්තක වන්නේ ය.

5. ටෙන්ඩර් විවෘත කරන වේලාවට වූ 1964.2.20 දින පෙරවරු 11ට කැමති ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

6. වැඩි විස්තර පහත අත්සන්කරුගෙන් විමසන්න.

ඒ. ඩබ්ලිව්. ගුණසිංහ,
ඉඩම් සංවර්ධන නිලධාරි, (අනුරාධපුරය.)

1964.1.22,
ඉ.සං./නිලධාරි කාර්‍යාලය,
අනුරාධපුරය.

1-974—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව

### ජලය පවිත්‍ර කිරීමේ යන්ත්‍රාගාරය

කෑගල්ල ජලය සැපයීමේ යෝජනා ක්‍රමයෙහි, ජලය පවිත්‍ර කිරීමේ යන්ත්‍රාගාරය තැනීම සඳහා එවන ටැන්ඩර් පත්‍ර කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1964 අප්‍රියෙල් මස 10 වැනි සිකුරාදා පූ.භා. 9.30 දක්වා භාරගනු ලැබේ. ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන වේලාව වන එදින පූ. භා. 10 ට ටැන්ඩර්කරුවන් එතනට පැමිණිය යුතුය.

2. රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැන (ඉදි කිරීම් සහ නඩත්තු) ගෙන් ඡෝරම කොළ ලබාගෙන අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියළු විස්තර සහ සැලැස්මවල් ඔහුගේ කාර්යාලයෙන් බලාගත හැක.

3. 1964 පෙබරවාරි මස 14 වැනි සිකුරාදා දහවල් 12 ට පෙර ටැන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල, රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

4. මෙම වැඩය සඳහා මෙහි පහත දැක්වෙන සුදුසුකම් ඇති කොන්ත්‍රාත්කරුවන් සුදුස්සන් වෙත්.

(ඒ) ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ "ඒ" සහ "බී" කාණ්ඩයේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් (ලියා පදිංචිය පිළිබඳ ලියවිලි ඉදිරිපත් කළ යුතුය).

(බී) "ඒ" සහ "බී" කාණ්ඩයේ සහ සම තත්ත්වයක් ඇති විදේශීය හා ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන්.

5. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන කල ටෙන්ඩර්කරුවන් විසින් වෙනත් ස්ථානවල වැඩි වශයෙන් නිරක්ෂ රේඛාසික පෙදෙස්වල කර ඇති මේ හා සමාන සහ යෝජිත වැඩය භාර ගැනීමට ඔවුන්ගේ කාර්ය මණ්ඩලයේ පූර්ණ සුදුසුකම් ලත් අය සිටින බවටද සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ඔවුහු තමන්ට කර්මාන්ත ශාලා පහසුකම්ද, ලංකාවේ ප්‍රාදේශීය නියෝජිතයින් වශයෙන් ගැනෙන්නන් බවද සනාථ කිරීමට සාධක ඉදිරිපත් කළ යුතු වේ.

සී. රාසයියා,
ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ.

1964 ජනවාරි මස 24 වැනිදා,
රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන
දෙපාර්තමේන්තුවේ දීය.

1–1010—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## 1964 වර්ෂයේ උඩරට දිසාවේ අරලු එකතු කිරීම සඳහා ටැන්ඩර් කැඳවීම

1964 වර්ෂයේ උඩරට දිසාවට අයත් කැලෑවලින් අරලු එකතු කිරීම සඳහා, නුවරඑළියේ උඩරට දිසා වන නිලධාරි විසින්, 1964 පෙබරවාරි මස 21 වෙනි දින පූ. භා. 10.00 දක්වා, නියමිත ආකෘති පත්‍රවල එවන ටැන්ඩර් භාර ගනු ලැබේ.

වැඩි විස්තර හා නියමිත ටැන්ඩර් ආකෘති පත්‍ර නුවරඑළියේ උඩරට දිසා වන නිලධාරිගෙන් ලබා ගත හැක.

එෆ්. ඇල්. ඇම්. පෙරේරා,
උඩරට දිසා වන නිලධාරි.

1964 ජනවාරි මස 23 දින,
නුවරඑළියේ උඩරට දිසා වන කාර්යාලයේදීය.

1–982—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## 1964 වර්ෂයේ උඩරට දිසාවේ කුරුඳුපොතු එකතු කිරීම සඳහා ටැන්ඩර් කැඳවීම

1964 වර්ෂයේ උඩරට දිසාවට අයත් කැලෑවලින් කුරුඳුපොතු එකතු කිරීම සඳහා, නුවරඑළියේ උඩරට දිසා වන නිලධාරි විසින්, 1964 පෙබරවාරි මස 21 වෙනි දින පූ. භා. 10.00 දක්වා, නියමිත ආකෘති පත්‍රවල එවන ටැන්ඩර් භාර ගනු ලැබේ.

වැඩි විස්තර හා නියමිත ටැන්ඩර් ආකෘති පත්‍ර නුවරඑළියේ උඩරට දිසා වන නිලධාරිගෙන් ලබා ගත හැක.

එෆ්. ඇල්. ඇම්. පෙරේරා,
උඩරට දිසා වන නිලධාරි.

1964 ජනවාරි මස 24 දින,
නුවරඑළියේ උඩරට දිසා වන කාර්යාලයේදීය.

1–981—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

1964 වර්ෂය තුළ ලංකාවේ නොයෙකුත් පළාත්වල රණවරා හා කබෙල්පොතු එකතු කිරීමේ බලය ලබාගැනීම සඳහා, 1964 පෙබරවාරි මස 12 වැනි දින පූ. භා. 10.00 වන තෙක්, කොළඹ, වැඩ බලන වන සංරක්ෂක විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් එදිනම දවල් 11.00ට විවෘත කරනු ලැබේ.

වැඩි විස්තර හා ටෙන්ඩර් පත්‍ර, කොළඹ කිව් පාරේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ලබාගත හැක. ටෙන්ඩර් පත්‍රයක් ලබා ගැනීමට පෙර, කච්චේරියක හෝ කොළඹ, ලංකා බැංකුවේ යෝක් වීදි ශාඛාවේ අංක 34 ගනක අංකයට වන සංරක්ෂක නමින් රු. 25ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ 1964 පෙබරවාරි මස 11 වෙනි දින දවල් 12.00 වන තෙක් පමණි.

ව්. ජෝ. වීරරත්න,
වන සංරක්ෂක වෙනුවට.

කැලෑ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 509,
කිව් පාර, කොළඹ 2,
1964. 1. 21.

1–983—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## දැව විකිණීම—රාජාංගනේ හා අංගමුව සංවර්ධනය පිණිස තෝරාගත් ප්‍රදේශ

වයඹ හා උතුරු මැද පළාත්වල රාජාංගනේ හා අංගමුව සංවර්ධනය පිණිස තෝරා ගත් ප්‍රදේශවල 1-5 කට්ටිවල දැව මුළුමනින්ම මිළදී ගැනීම පිණිස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන පුද්ගලයින් රුපියල් සියයක් (රු. 100ක්) වන සංරක්ෂකගේ වාසියට ලංකා බැංකුවේ යෝක් වීදියේ ශාඛාවෙහි අංක 34 දරණ ඔහුගේ ගිණුමට මුදලින් තැන්පත් කළ යුතු අතර ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිකුත් කිරීමට පෙර ඒ සඳහා වූ කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

3. 1964 පෙබරවාරි මස 15 වන සෙනසුරාදා මධ්‍යාහන 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

4. 1964 පෙබරවාරි මස 17 වන සඳුදා පෙ. ව. 10.00ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කරනු ලැබේ.

5. අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ, වන සංරක්ෂකගේ කාර්යාලයෙන්, උතුරු මැද පළාතේ ත්‍රිකුණාමලේ දිශා වන නිලධාරිගෙන්, වයඹ දිශාවේ කුරුණෑගල දිශා වන නිලධාරීගෙන් හෝ පුත්තලමේ වන පාලකගෙන් හා අනුරාධපුර අඩවි වන නිලධාරීගෙන් ලබා ගත හැකිය.

ඩබ්ලිව්. ජී. වීරරත්න,
වන සංරක්ෂක වෙනුවට.

1964. 1. 25 වන දින,
කොළඹ 2,
තැ. පෙ. 509, දරණ තැන,
අංක 5, කිව් පාරේ,
වන සංරක්ෂකගේ කාර්යාලයේදීය.

1–1005—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරුතුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1964 මාර්තු 10 වැනි දින උදේ 10 වන තෙක් භාර ගනු ලැබේ:—

(1) දෙව්නුවර මාතෘ නිවාසයට ජලය සැපයීම.

(2) ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1964.2.21 වැනි සිකුරාදා සවස 4 වන තෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 15,000කට වඩා වටිනාකම ඇති ජල කර්මාන්තයන් සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාංශයේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

(3) සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

(4) කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් සියයට 5ට වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳී මක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

(5) ටෙන්ඩර් පත්, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත්, ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරි තුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

(6) ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

(7) පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී හැම ඉල්ලුම් කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

ඊ. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434, කොළඹ 7.
1964.1.21 වැනිදා.

1–908—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 පෙබරවාරි මස 21 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර රත්නපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. ර/ගලඋඩකන්ද විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 2. ර/කජුගස්වත්ත විද්‍යාලය | එම |
| 3. ර/කැකුල විද්‍යාලය | එම |

සංලක්ෂ්‍යය 1—ර=රත්නපුර දිස්ත්‍රික්කය

සංලක්ෂ්‍යය 2.—අවශ්‍ය ලියා පදිංචි කිරීම.

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ සියළුම වැඩ සඳහා රු. 12,000.

2. ඉහත සඳහන් 2 වැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති අයට, විවිධ සේවා සමූපකාර සමිතිවලට, කම්කරු සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 පෙබරවාරි මස 20 වෙනිදා දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ එච්. ඒ. ශාඛාවේ, රත්නපුර අධ්‍යාපන කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක එම වැඩය සඳහා රු. 100 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් රත්නපුර සහාය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ අයට පමණි. චෙක්පත්, මුදල් ඕඩර, පෝස්ටල් ඕඩර යනාදිය භාර ගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර රත්නපුර සහාය අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

4. පූර්වෝක්ත 2 වැනි ඡේදයේ සඳහන් වන පරිදි සහාය අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ 2 වැනි පිටපතකුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු රත්නපුර සහාය අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, අධ්‍යාපන කාර්යාලය, රත්නපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි තැපෑලෙන් නො එවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් රත්නපුර අධ්‍යාපන කාර්යාලයේ පාලන සහකාර තැනට ඒවා භාර දී භාරගත් බවට එකෙණෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද, සඳහන් කළ යුතුය.

5. 1964 පෙබරවාරි මස 21 වැනි දින පස්වරු 2.30 ට රත්නපුර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට ඒවා විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරිතැන විසින් ගාස්තු ප්‍රමාණයද (රේට් ගණන්) ටෙන්ඩර්කරුවන්ගේ නම්ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති 6 කට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර රත්නපුර සහාය අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද එහිදී පරීක්ෂා කර බැලිය හැක.

8. තෝරාගනු ලබන ටෙන්ඩර් කරුවන් විසින් සේවයේ යෙදවිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදවීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී ඇර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළා සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදවීම තහනම්ය.

ව. මෙ. අ. වර්නසූරිය,
සහාය අධ්‍යාපන අධ්‍යක්ෂ, රත්නපුර.

1964 ජනවාරි මස 24 වෙනිදා,
රත්නපුර, අධ්‍යාපන කාර්යාලයේදීය.

1–963—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

සුදු පාට කපු නූල් රොඩු සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ප්‍රවාහණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය: මහ ලේකම් කායඹාලය, භාණ්ඩාගාරය, කොළඹ 1) 1964 පෙබරවාරි මස 26 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට හා හරියාකාර ඉටු කිරීමට තමාගේ මූදල් තත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට ඒ සම්බන්ධව ලියකිය විලි ඉදිරිපත් කළ යුතුය.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරීගේ කායඹාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කායඹාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1964 පෙබරවාරි මස 25 වැනි අඟහරුවාදා පස්වරු 3.30 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1964 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ප්‍රවාහණ අමාත්‍යාංශ කායඹාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරීගේ කායඹාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1964 ජනවාරි මස 25 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹදීය.

1–1009—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### සී. ඈන් 3182 දරණ ලෑන්ඩ්රෝවරය විකිණීමයි

දැනට, නුවරඑළිය කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොම සාරිස් වරයාගේ කාර්යාලයේ තිබෙන ඉහත සඳහන් ලෑන්ඩ් රෝවරය විකිණීම පිළිබඳව, කොළඹ, මහා ලේකම් කාර්යාලයේ, තැ. පෙ. අංකය: 500, පළාත් පාලන කොමසාරිස් වරයා විසින් 1964 රේ පෙබරවාරි මස 17 වැනිදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

මේ සඳහා රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතු ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ඇතුළත් ලියුම් කවරය පිට "ලෑන්ඩ් රෝවරය විකිණීම පිළිබඳ ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රය" යනුවෙන් සඳහන් කොට එය සඳහන් ලිපිනයට එවිය යුතුවාත් හැර, ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් ඕනෑම කච්චේරියක හෝ කොළඹ රජයේ මහා භාණ්ඩාගාරයේ හෝ තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඊට ඇතුළත් කළ යුතු ද වන්නේය.

මෙම ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර, 1964රේ පෙබරවාරි මස 17 වැනිදා පෙරවරු 10ට කොළඹ, ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ අංක 267 දරණ කාමරය, පළාත් පාලන කොමසාරිස් වරයාගේ කාර්යාලයේදී විවෘත කරනු ලබන අතර, ටෙන්ඩර් ඉල්ලුම් කරුවන් එදින එමවේලාවේදී එම ස්ථානයට පැමිණ සිටීමට ද හැකි වන්නේය.

ටෙන්ඩර් ඉල්ලුම් කරුවන් විසින් නුවරඑළියේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ කාර්යාලයේදී යථෝක්ත වාහනය පරීක්ෂා කර බලා එහි තත්ත්වය පිළිබඳ යථාවබෝධයක් ලබාගත යුතුවා මිස පළාත් පාලන කොමසාරිස් වරයා විසින් මෙම වාහනයේ තත්වය පිළිබඳ සහතික කරනු ඇතැයි බලාපොරොත්තු නොවිය යුතුය. තවද, ටෙන්ඩර් ඉල්ලුම් කරුවාගේ ටෙන්ඩර ඉල්ලුම් පත්‍රය භාරගන්ට යෙදුන බව ඔහු වෙත දැනුම් දෙනු ලැබීමෙන් සතියක් ඇතුළත දී ඔහු විසින් මෙම වාහනය මිලයට ගැනීම පිළිබඳ කටයුතු සම්පූර්ණ නොකරනු ලැබුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 රාජසන්තක වනවා ඇත.

පළාත් පාලන කොමසාරිස් වරයා විසින් ඕනෑම අයෙකුගේ හෝ අයවලුන්ගේ ටෙන්ඩර ඉල්ලුම් පත්‍රයක් හෝ ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර හේතු සාධක ඉදිරිපත් නොකරම, ප්‍රතික්ෂේප කර සිටිනු හැකිය.

මේ සඳහා විශේෂ ටෙන්ඩර් ආකෘති පත්‍ර නොමැති බව සැලකිය යුතුය.

සී. ඩබ්. ඒ. එස්. ඇන්තනි,
පළාත් පාලන කොමසාරිස් වෙනුවට.

වර්ෂ 1964 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ, පළාත් පාලන කාර්යාලයේ දීය.

1–857—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## ලුණු දෙපාර්තමේන්තුව

### පොල් අතු සැපයීම

වර්ෂ 1964 මාර්තු මස 1 වැනි දින සිට 1964 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා අලිමන්කඩ ලුණු ලේවායට (ඉරු දෙකේ) පොල් අතු 3,00,000ක් පමණ සැපයීම සහ ගෙනවිත් භර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ, 404, බුලර්ස් පාරේ වානිජ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 පෙබරවාරි මස 26 වෙනි බදාදා පස්වරු 2 වනතුරු භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කායඹාලයෙන් හෝ යාපනේ දිසාපති තැනගෙන් හෝ අලි මන්කඩ ලුණු අධිකාරී තැනගෙන් ලබා ගන්නා ටෙන්ඩර් ආකෘති පත්‍ර වලය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් කායඹාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ලුණු කොමසාරිස් කායඹාලයේ කරණ තැන්පත් චැක්පත් වලින් සැපයිය යුතුයි.

වැඩි විස්තර ලුණු කොමසාරිස් කායඹාලයෙන් හෝ අලිමන්කඩ ලුණු අධිකාරි කායඹාලයෙන් ලබා ගත හැකිය.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
වැ. බ. ලුණු කොමසාරිස්,

1964 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ 2.

1–932—64.1.31 දින අංක 13937, දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**තාර පීප්ප සැපයීමට හා ගෙනවිත් භාරදීමට ටෙන්ඩර් පත්‍ර කැඳවීම**

තාර පීප්ප සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 පෙබරවාරි මස 19 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් බාරගනු ලැබේ. 1964 පෙබරවාරි මස 20 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ දී පෙනී සිටිය හැක.

2. කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඈෆ් ඈම්. ශාඛාවේ දී, ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර රජයේ වැඩ අධ්‍යක්ෂ තැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතනවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය.

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන, නිදර්ශන: චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති සහ,

(ඈ) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමුපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

වී. අරසරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1964.1.24.

1–966—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**මීගමු දිස්ත්‍රික්කයේ සිල් කෝට් වැඩ/ප්‍රෙමික්ස් වැඩ/මාර්ග මතුපිට නැවත සකස් කිරීමේ වැඩ සඳහා කලුගල් සපයා බාරදීම**

රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 පෙබරවාරි 26 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් මෙහි පහත සඳහන් කළුගල් සපයා බාරදීමට ටැන්ඩර් පත් කැඳවනු ලැබේ:—

අඟල් 1/2 ගල් කියුබ් 500, අඟල් 3/4 ගල් කියුබ් 50.

අඟල් 2 ගල් කියුබ් 1,750ක් සහ අඟල් 4 ගල් කියුබ් 100.

1964 පෙබරවාරි 27 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ටැන්ඩර් පත් විවෘත කරන වේලාවට ටැන්ඩර්කරුවන්ට ටැන්ඩර් මණ්ඩල කාර්යාලයේ පෙනී සිටිය හැක.

2. මීගමුවේ විධායක ඉංජිනේරු කාර්යාලයෙහිදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර මීගමුවේ විධායක ඉංජිනේරුතැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍ය ය:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන, නිදර්ශන: චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමුපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 පෙබරවාරි 21 වීන සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. ටැන්ඩර් ඉදිරිපත් කිරීම ලාංකිකයින්ටද, ලාංකික වෙළඳ සමාගම්වලට සහ අනිකුත් ලාංකික සමාගම්වලට සීමාකර තිබේ.

වී. අරසරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1964 ජනවාරි 24 දින.

1–967—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

1964 වර්ෂය තුළදී තංගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි රජයේ ගොඩ නැගිලි නඩත්තුව සහ සුලු වැඩිදියුණු කිරීමේ වැඩ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 පෙබරවාරි මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. තංගල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000 ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ ආ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඒ. සාම්බසිවම්,
දකුණු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන.

ගාල්ලේ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
අධිකාරි ඉංජිනේරු කාර්යාලයේදීය. 1964.1.10.

1–864—64.1.31 දින අංක 13937, දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## යුධ හමුද මූලස්ථානය

**රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ තීරණ අනුව ; 1963–64 මුදල් වර්ෂය තුළ යුද්ධ හමුදවේ එක් එක් පලාත්වල පිහිටා ඇති කඳවුරුවලට සලාක හා අනිකුත් සේවා සැපැයීම ; මෙහි පහත සඳහන් අය වෙත පවරා තිබේ.**

| සේවා විස්තර | කොළඹ | පනාගොඩ | දියතලාව | ත්‍රිකුණාමලය | මන්නාරම | යාපනය | රිදියාගම | අම්පාරේ |
|---|---|---|---|---|---|---|---|---|
| මස් සැපැයීම | 10 | 10 | 10 | 15 | 5 | 14 | 2 | 1 |
| අළුත්මාලු සැපැයීම | 8 | 8 | 4 | 3 | 5 | 14 | 16 | 1 |
| වෙඩරු සහ බිත්තර සැපැයීම | — | — | 10 | 9 | 16 | 16 | 2 | 1 |
| එළවළු සැපැයීම | 8 | 8 | 10 | 17 | 10 | 14 | 16 | 17 |
| දර සැපැයීම | — | — | 10 | — | 10 | 10 | — | — |
| පොල් සැපැයීම | 12 | 12 | 4 | 15 | 10 | 14 | 2 | 11 |
| කසළ ශෝධක සේවා සැපැයීම | — | — | 4 | — | — | — | — | — |
| රජක සේවා සැපැයීම | 13 | 7 | 6 | 13 | 13 | 13 | 6 | 6 |

ඉහත සඳහන් අංකවලින් මෙහි පහත පෙනෙන කොන්ත්‍රාත්කරුවන් දක් වේ.

(1)
පී. ඒ. අමරතුංග මයා.,
අම්පාරේ

(2)
එස්. කේ. බාලසුබ්‍රමනියම් මයා.,
69, ආදුරුප්පු වීදිය,
කොළඹ.

(3)
එච්. ඩබලිව්. දවිත් සිංඤෝ මයා.,
උතුරු වෙරලපාර,
ත්‍රිකුණාමලය

(4)
ආර්. ඇම්. ප්‍රනාන්දු සහ සමාගම.,
දියතලාව,

(5)
ඇස්. ටී. ප්‍රනාන්දු මයා.,
423, ඩොක්යාඩ් පාර,
ත්‍රිකුණාමලය

(6)
ඩබලිව්. ඩී. ප්‍රනාන්දු මයා.,
බ්‍රෙන්ඩියවත්ත,
වැල්ලම්පිටිය

(7)
ඩබ්. ඇස්. ඇක්මන් ප්‍රනාන්දු මයා.,
89/12, වැකන්ද පාර,
කොළඹ 2

(8)
ජනතා සප්ලයිර්ස් සමාගම,
212/53 ගැස් කර්මාන්ත පාර,
කොළඹ 11

(9)
ඒ. එස්. එම්. ජෙගනාදන් සහ සමාගම,
ත්‍රිකුණාමලය

(10)
එම්. කාදර් අලි සහ සමාගම,
482, ඩාලි පාර,
කොළඹ

(11)
නිව් සිටි බේකරි සහ ස්ටෝර්ස්,
අම්පාරේ

(12)
ඩී. ඇම්. රාජපක්ෂ මයා.,
213, පන්සල පාර,
කොළඹ

(13)
ඩැනිසන් රණසිංහ මයා.,
පහළ වැව පාර,
කොළඹ

(14)
එස්. ටී. ෂන්මුගනාදන් මයා.,
63, කස්තුරියර් පාර,
යාපනය

(15)
ජේ. එම්. ෂෙරිප් මයා.,
85, නිව් මුඅර් ලේන්,
ත්‍රිකුණාමලය

(16)
පී .ජී. සිල්වා මයා.,
166, රෙක්ලමේෂන් පාර,
කොළඹ

(17)
ජේ. පී. ගුණදස මයා.,
ත්‍රිකුණාමලය

ඉහත කී සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් ගේ මිල ගණන් යුද හමුද ප්‍රධාන කායර්‍යාලයේ ඇති දෙපාර්තමේන්තු දන්වීම් පුවරුවේ, මෙම දිනයේ සිට මාසයක් පමණ ප්‍රදර්ශනය කරන ලදී. එම කාලයට පසු එම විස්තර යුද හමුදවේ " උ " ශාකාවෙන් දන ගැනීමට පිළිවන.

ජී. ආර්. ජයසිංහ,
මේජර් ජනරාල්,
යුද හමුද ආඥපති වෙනුවට.

අංකය : සිජ්/කෘ/104.
1964 ජනවාරි 23 දින,
කොළඹ,
යුද හමුද මූලස්ථානයේ දී ය.

1–962—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ප්‍රයෝජනයට අයෝග්‍ය පරණ බඩු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

පොළොන්නරුව, කෘෂිකර්ම ස්ථානයේ දී 1964 පෙබරවාරි මස 21 වැනි සිකුරාදා පෙරවරු 10.00 ට පාවිච්චියට අයෝග්‍ය ට්‍රැක්ටර්, ඇන්ජිම සහිත " ස්ට්‍රෝ බේලරය " (ජෝන්ඩියර්) නගුල්, (රැන්සම්) තැටි නගුල්, (ජෝන්ඩියර්) පැර්මෝල් තැටි නගුල් සහ පාර්මෝල් කොකු නගුල් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහිදී බඩු මිළයට ගනු ලබන අය. වෙන්දේසිය හමාර වූ පසු නියමිත මුදල් ගෙවා තමන් විසින් මිළයට ගත් බඩු ඉවත් කරගත යුතුයි. ඉවත් කර නැති මිළයට ගත් බඩු සම්බන්ධයෙන් ගොවිපළ කළමනාකාර තැන විසින් කිසිම වගකීමක් නොකරණු ලැබේ.

3. විකිණීමට තිබෙන බඩුවල විස්තර පොළොන්නරුව කෘෂිකර්ම මධ්‍යස්ථානයේ ගොවිපල කළමනාකාර තැනගෙන් ලබාගත හැකි අතර එම භාණ්ඩ වෙන්දේසියට පෙර දිනයේ දී පරීක්ෂා කිරීමට හැකිය.

ඒ. පී. ඇම්. සිල්වා,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964 ජනවාරි මස 21 වෙනිදා,
පේරාදෙණිය.

1–909—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

## රේගුවේ ප්‍රසිද්ධ වෙන්දේසියක්

පහත සඳහන් බඩු 1964 පෙබරවාරි 6 වන දින පෙරවරු 10 ට රේගුවේ ගමන් බඩු කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලැබේ.

මෙම බඩු 5 වන බදාදා පස්වරු 1 සිට 4 දක්වා සෝදිසි කල හැක.

| | |
|---|---|
| රොලෙක්ස් ඔයිස්ටර් සිකිං ඉන් ඔර්ලෝසු ... | 1 යි |
| ඔමේගා සීමාස්ටර් (ස්වයංක්‍රියාකාරි) අත් ඔර්ලෝසු | 1 යි |
| තවත් අත් ඔර්ලෝසු ... ... | 5 යි |
| 'ඇරෝ' කමිස ... ... ... | 7 යි |
| 'මැකිසිම්' කමිස ... ... ... | 2 යි |
| රැවුල බාන යන්ත්‍ර ... ... ... | 1 යි |

කැරට් 2350 බරැති රත්ගුන් දියමන්ති තොගයක්.

මැණික් ගල්, රත්රන් ආභරණ, රිදී භාණ්ඩ යනාදිය වෙත්.

බී. අයි. ගුණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : බී.ඕ. 148 (කාණ්ඩ 2).
1964 ජනවාරි 22 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

1–931—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසියේ විකිණීමයි

1964 පෙබරවාරි මස 21 වෙනි දින පෙරවරු 10 ට නැගෙනහිර දිසාවේ, දිසා වන නිලධාරි විසින් හල්මිල්ල, බුරුත, රාණි, හුලන් හික් ඈදී කොට ඇති කඳන් ඝන අඩි 295 කට සමාන කඳන් 22 ක් මඩකලපුව මධ්‍යම දැව ගබඩාවේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව වෙන්දේසියට පෙර ඉල්ලුම්කරුවනට පරීක්ෂාකර බැලිය හැක. මෙයට අදාල වැඩි විස්තර නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරිගෙන් හෝ මඩකලපුව දැව ගබඩාවේ සහකාර ගබඩා පාලකගෙන් ලබාගත හැක.

වී. රූ. නානායක්කාර,
දිසා වන නිලධාරි, නැගෙනහිර දිසාව.

දිසා වන කාර්යාලය,
මඩකලපුව.
20. 1. 64.

1–979—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියයි

නාරාහේන්පිට පිහිටා ඇති, පොලිස් මධ්‍යම ගරාජයේදී, 1964 පෙබරවාරි මස 15 වැනි සෙනසුරාදා පෙ.ව. 9 ට පහත සඳහන් පාවිච්චි කළ නොහැකි, මෝටර් වාහන ආදිය ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලැබේ :—

මෝටර් රථ
ලැන්ඩ් රෝවර්
ඊ.වයි. 4622
ඊ.වයි. 4994
ඊ.එල්. 3730
ඊ.එල්. 3731
ඊ.එල්. 3732
ඊ.එල්. 3733
ඊ.එල්. 3734
ඊ.එල්. 3735
ඊ.එල්. 3736
ඊ.එල්. 3737
ඊ.එල්. 3738
ඊ.එල්. 3739
ඊ.එල්. 5817
ඊ.එල්. 5818
ඊ.එල්. 5819
ඊ.එල්. 5820
ජීප් රථ
ඊ.එන්. 1638
ඊ.එන්. 1639
ඊ.එන්. 1642
ඊ.එන්. 5287
වෑන් රථ
සී.වී. 1404
ලොරි
සී.ඊ. 5348 (ඩොජ්)
මෝටර් කාර්
ඊ.වයි. 4073 ඒ/70
ඊ.වයි. 4075 ඒ/70
ඊ.වයි. 4646 ඒ/40
ඊ.වයි. 4647 ඒ/40
සී.වයි. 4614 12/4

මෝටර් බයිසිකල්
ඊ.වයි. 4424 ගෝල්ඩන් ෆ්ලෑෂ්
ඊ.වයි. 4426 එම
ඊ.වයි. 4427 එම
ඊ.වයි. 4429 එම
ඊ.වයි. 4430 එම
ඊ.වයි. 4579 එම
ඊ.වයි. 4753 එම
ඊ.වයි. 4757 එම
ඊ.වයි. 4758 එම
ඊ.වයි. 2205 ට්‍රම්ප්
ඊ.වයි. 2206 එම
ඊ.වයි. 2207 එම
ඊ.වයි. 2670 එම
ඊ.වයි. 2671 එම
ඊ.වයි. 2766 එම
ඊ.වයි. 2769 එම
ඊ.වයි. 2772 එම
ඊ.වයි. 2774 එම
ඊ.වයි. 4990 එම
ඊ.වයි. 4993 එම
ඊ.වයි. 4855 එම
ඊ.එන්. 5216 එම

ඉහත සඳහන් මෝටර් වාහණ 1964 පෙබරවාරි මස 14 වැනි සිකුරාද පෙ.ව. 9 සිට ප.ව. 4.30 දක්වා කාලසීමාව තුළ පොලිස් මධ්‍යම ගරාජ භූමියේදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇත.

වෙන්දේසියෙන් ලබා ගත් මෝටර් වාහණ, මුදල් ගෙවා 1964 පෙබරවාරි මස 15 වැනි සෙනසුරාද ප.ව. 4 ට ප්‍රථම එම ස්ථානයෙන් ගෙන යා යුතුයි.

වෙන්දේසියෙන් ලබාගත් මෝටර් වාහණ ඉහත සඳහන් කාලසීමාව තුළ ගෙන නොගිය හොත් වාහණ ගැන මෙම දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

ඩී. ඇස්. ඇස්. ජයතිලක,
සහකාර පොලිස් අධිකාරි (ප්‍රවාහණ අංශය).

පොලිස් ප්‍රවාහණ කාර්යාලය,
නාරාහේන්පිට, කොළඹ 5,
1964 ජනවාරි මස 27 වැනි දින දීය.

1–1016—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසියේ විකිණීමයි

1964 පෙබරවාරි මස 17 වෙනි දින පෙරවරු 10ට නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි විසින් හල්මිල්ල, හුලන් හික්, පළු, රාණි ඈදීකොට ඇති ඝන අඩි 785කට සමාන කඳන් 82ක් කල්මුනේ මධ්‍යම දැව ගබඩාවේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව වෙන්දේසියට පෙර ඉල්ලුම්කරුවනට පරීක්ෂාකර බැලියහැක. මෙයට අදාල වැඩි විස්තර නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරිගෙන් හෝ කල්මුනේ සහකාර ගබඩා පාලකගෙන් ලබාගත හැක.

වී. රූ. නානායක්කාර,
දිසා වන නිලධාරි, නැගෙනහිර දිසාව.

මඩකලපුව,
දිසා වන කාර්යාලය,
20. 1. 64.

1–980—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ දේවමැද්දේ කෝරළේ වැවගෙදර පිහිටි බතලගේතෝවත්ත නමැති වට්ටිනා දේපළ එහි පිහිටි ගොඩනැගිලි සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

ලංකා රජයේ උගස් බැංකු ආඥාපනතේ 63 (1) (දැනට 1956 ව්‍යවස්ථාපිත අණපනතහි 398 වැනි පරිච්ඡේදයේ 62 (1) )දරණ වගන්තිය යටතේ ලංකා රජයේ උගස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නාලද විශේෂ තීරණයක් විධිමත්ව ගැසට් පත්‍රයේ පළකර ප්‍රසිද්ධ කිරීමෙන් ඒ යටතේ ලැබී ඇති බලතල අනුව සහ එකී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් බලයලත් පරිදි,

1. 1947.7.15 වෙනි දින පී. තම්බිරාජා ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 220 දරණ උගස්කරය පිට සහ 1958.4.7 වෙනි දින ඇම්. වී. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 94 දරණ උගස්කරය පිට ගලප්පත්තිගුරුගේ පීරිස් සිල්වා නොහොත් ගලප්පත්තිගුරුගේ පීරිස් ද සිල්වා මහත්මා විසින් මෙම බැංකුවට ඇප වශයෙන් උගස්කරනලද ඇල් ජී. ඕ. වුඩ්හවුස් මිණුම් පති විසින් සහතික කරන ලද 1938 ජනවාරි මස 18 වෙනි දින අංක පී 16411 දරණ පිඹුරේ ප්‍රකාර අක්කර අටයි, රූඩ් දෙකයි, පර්චස් විසිතුනක (අ. 8, රූ. 2, ප. 23) ප්‍රමාණයෙන් යුත් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ දේවමැද්දේ කෝරළේ වැවගෙදර පිහිටි බතලගේතෝවත්ත නමැති බිම් කට්ටිය සහ,

2. ඇල්. ජී. ඕ. වුඩ්වඩ්ස් මිණුම්පති විසින් සහතික කරනලද 1938 ජනවාරි මස 18 වෙනි දින අංක පී 16412 දරණ පිඹුරේ ප්‍රකාර අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් තිස්පහක (අ. 1, රූ. 3, පර්. 35) ප්‍රමාණයෙන් යුත් ඉහතකී වැවගෙදර පිහිටි බතලගේතෝවත්ත නමැති බිම් කට්ටිය.

ඉහතකී උගස්කර පිට අයවිය යුතු මුදල වන රු. 8,626.82 අයකර ගනු සඳහා සහ 1961.10.26 වෙනි දින සිට වෙන්දේසිය සිදුකරන දින දක්වා රු. 7,418.32ට අවුරුද්දකට සියයට 5½ බැගින් ද, රු. 431.72ට අවුරුද්දකට සියයට 7 බැගින් ද පොළිය අයකරගනු සඳහා සහ ලංකා රජයේ උගස් බැංකු ආඥාපනතේ 64 වෙනි වගන්තිය (දැනට 1956 ව්‍යවස්ථාපිත අණපනත්හි 398 වැනි පරිච්ඡේදයේ 63 වෙනි වගන්තිය) යටතේ අයකරගත හැකි විය හියදම් සහ අනිකුත් මුදල් ද අයකරගනු සඳහා,

1964 පෙබරවාරි මස 22 වෙනි ශනි දින අ. භා. 5ට එය පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ හෝර්ටන් පෙදෙසේ අංක 91 දරණ තැන ලංකා රජයේ උගස් බැංකුවෙන් ලබාගත හැකිය.

වින්ස්ටන් මෙලිස් ප්‍රනාන්දු,
බලය ලත් වෙන්දේසිකරු.

35, කැනල් රෝ,
තැ. පෙ. 145,
කොළඹ 1.
ටැලිපෝන් 4755.

1–417—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කබගමුව නිවාස යෝජනා ක්‍රමය-නිවාසයක් තනාගැනීම

යථෝක්ත නිවාස ක්‍රමයේ නිවාසයක් තැනීම සඳහා වෙන්කර ඇති හිස්බිම් කොටසක නිවාසයක් තනාගැනීම සඳහා මෙහි පහත දක්වෙන සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. (අ) තමන්ගේ සහ තම භාර්යාවගේ/පුරුෂයාගේ නමින් හෝ තමන්ගෙන් යැපෙන ළමයෙකුගේ නමින් ගෙයක් හෝ ගෙයක් සෑදීමට සුදුසු ඉඩමක් නොමැති අය,

(ආ) තමන්ගේ සහ තම භාර්යාවගේ/පුරුෂයාගේ මාසික ආදායම් රු. 400කට නොවැඩි අය,

(ඇ) ගලිගමුව ඡන්ද කොට්ඨාශය තුළ අවුරුදු පහකට නොඅඩු සථිර පදිංචියක් ඇති හෝ සථිර අයිතිවාසිකම් ඇති අය.

3. තෝරාගනු ලබන අයවෙත දෙනු ලබන ඉඩම් කැබෙල්ලෙහි වර්ගයක් ඇතුළතදී දෙපාර්තමේන්තුවෙන් දෙනු ලබන සැලැස්ම අනුව නිවස තනා නිමකළ යුතුය. (එහෙත් දෙපාර්තමේන්තුවේ අනු දැනුම ඇතිව තමාගේ අභිමතය පරිදි සැලැස්මේ වෙනස්කම් කරගත හැකිය) මෙම සැලැස්ම මහනුවර මගේ සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයේදී පරීක්ෂාකර බැලිය හැක.

4. නිවාසය තැනීම සඳහා දළවශයෙන් රු. 4,650ක් පමණ වැය වෙතැයි ගණන් බලා ඇති අතර, මෙම මුදල දෙපාර්තමේන්තුව හා කොන්ත්‍රාත්තුවකට අත්සන් කිරීමෙන් පසුව ණය මුදලක් වශයෙන් ලබාගත හැකිය. කොන්ත්‍රාත්තුව අනුව කළවැඩ වෙනුවෙන් බිල්පත් ඉදිරිපත් කළවිට මුදල් ගෙවනු ලැබේ.

5. තෝරාගත් බදුකරුට නිවාසය ඉදිකිරීමේ කටයුතු ඇරඹීමට යම් මුදලක් අවශ්‍ය නම් දෙපාර්තමේන්තුවට පිළිගතහැකි ඇපකරුවෙකුගේ ඇපයක් උඩ ඒ සඳහා අත්තිකාරම් මුදලක් ලබාගත හැක.

6. දෙපාර්තමේන්තුව ඉඩම සහ ගෙය සඳහා වැයකර ඇති මුදල අවුරුදු 25කින් අයවෙන පරිදි කොටස්කර මාසික කුලිය නියම කරනු ලැබේ. දළ වශයෙන් මාසික කුලිය රු. 30ක් පමණ විය හැකිය. ඉදිරිකාලයේදී පොදු පහසුකම් සඳහා යම් මුදලක් දෙපාර්තමේන්තුවට වැය කිරීමට සිදුවුවහොත් එම මුදලද නිවාස ක්‍රමයේ පදිංචි කරුවන්ගෙන් පොදුවේ අයකර ගන්නවා ඇත.

7. ඉල්ලුම් පත් පිළියෙල කළයුත්තේ මහනුවර මගේ සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ කෑගල්ලේ දිසාපති කාර්යාලයෙන් නොමිලේ ලබාගතහැකි ආකෘති පත්‍රවලය. පිළියෙල කළ ඉල්ලුම්පත් පහත සඳහන් ලිපිනයට 64.2.21 දිනට පෙර ලැබෙනසේ යැවිය යුතුය. එම ඉල්ලුම් පත් බහා යවන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහල කෙළවරේ "කබගමුව නිවාස සඳහා ඉල්ලුම් පත්" යන්න සඳහන් කළ යුතු වේ.

8. ඉල්ලුම් පත් යැවිය යුතු ලිපිනය :

ජාතික නිවාස සහකාර කොමසාරිස්,
මධ්‍යම වෙළෙඳ සැල,
මහනුවර.

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දින සිට දින 21ක් ගතවූ පසු එම ඉල්ලුම් පත ලැබුණු බවට දැන්වීමක් නොලැබුණහොත් ඒ බැව් ලියා පදිංචිකළ තැපැලෙන් යැවෙන ලිපියකින් මහනුවර මගේ සහකාර කොමසාරිස් තැනගෙන් විමසිය යුතුය.

ඩී. ටී. ජී. ඒ. ද පොන්සේකා,
ජාතික නිවාස කොමසාරිස්,

1964 ජනවාරි 9.

1–444—64.1.31 දින අංක 13,937 දරන ගැසට් පත්‍රය

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි